# සතුට පිරුණු, සිනා සපිරි, හැමෝගේම පාසල



අපි පාසලට ඇතුළු වන විට බුදු මැදුර අසල මිදුලේ ඔවුහු පන්දුවකින් ක්‍රීඩා කරමින් සිටියහ. නම කියා යොමුකරන පන්දුව අල්ලාගත් ළමයා තවත් නමක් කියමින් පන්දුව යොමුකරයි. සියල්ලන්ම සිටියේ සතුටිනි.

විවිධ අවශ්‍යතාවන්ට එතැනින් එහා මෙහා ගිය පාසලේ අනෙකුත් ළමයි හා ගුරුවරු ද ඔවුන් දිරිගැන්වූහ. අතහැරුණු පන්දු අහුලා දීම වැනි ක්‍රියාවන්ගෙන් සහභාගී වූහ.

එසේ ක්‍රීඩා කරමින් සිටියේ එම පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයේ සිසු සිසුවියන්ය. ඔවුන් අතර ඩවුන් සින්ඩ්‍රෝම්[1] තත්වයේ සිටින ළමයි සහ බුද්ධිමය දුබලතා සහිත ළමයි ද සිටියහ.

එම ඒකකය භාරව කටයුතු කරන සෝමා මහත්මියගේ මෙහෙයවීමෙන් එම ළමයින් සතුටින්, කෙළිදෙලෙන් ඉගෙනගන්නා ආකාරය අපි දවස පුරා නිරීක්ෂණය කළෙමු.

"මං මේ අවුරුද්දෙ විශ්‍රාම ගන්නවා. මෙහෙම සේවාවක් කරන්නට ලැබුණු එක ගැන මං ගොඩක් සතුටු වෙනවා," යි සෝමා ගුරුතුමිය පැවසුවාය.

එම ප්‍රදේශයේ විශේෂ අධ්‍යාපන පුහුණු ගුරුවරුන්ගේ හිඟයක් පවතින බව අපට අසන්නට ලැබුණි. සෝමා ගුරුතුමිය ප්‍රාථමික අධ්‍යාපන පුහුණු ගුරුවරියකි. එම පාසලේ ප්‍රාථමික අංශ ප්‍රධානීවරිය ලෙස සෙසු ප්‍රාථමික පන්ති අධීක්ෂණය කරන්නේ ද ඇයයි. සිය ප්‍රාථමික අධ්‍යාපන වෘත්තීය පුහුණුවට විශේෂ අධ්‍යාපනය පිළිබඳ දැනුම ද එකතු කරගත් ඇය ගුරු හිඟය හේතුවෙන් වැසී යන්නට ආසන්නව තිබුණු පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයට පණ දුන්නාය. ඇයට පාසලේ සේවය කළ විදුහල්පතිවරුන්ගේ, විශේෂ අධ්‍යාපනය භාර ගුරු උපදේශකවරුන්ගේ හා විෂය අධ්‍යක්ෂවරුන්ගේ සහාය නොමඳව ලැබිණි. අන්තකර්රණ අධ්‍යාපනය සම්බන්ධ පුහුණුවීම් සඳහා අවස්ථාව ලැබිණි.

---

[1] ඩවුන් සින්ඩ්‍රෝම් යනු ජානමය විකෘති තත්වයකි. මෙම තත්වය සොයා ගනු ලැබුවේ බ්‍රිතාන්‍ය ජාතික වෛද්‍ය විශේෂඥයෙකු වූ John Langdon Down විසින් බැවින් ඩවුන් සින්ඩ්‍රෝම් නමින් හැඳින්වේ.

“පුහුණුව විතරක් මදි. මේ ළමයින් ගැන සහකම්පනයත් අවශ්‍යයි,” යි සෝමා ගුරුතුමිය පැවසුවාය. “මවක් විදියට මට මගේ පන්තියේ ඉන්න ළමයින්ගේ මව්පියන්ගේ හදවත හොඳට තේරෙනවා. මම මට කළ හැකි උපරිම සේවය කරනවා.”

මේ පන්තියේ දරුවන්ට සංගීතමය, නතර්න, චිත්‍ර හා ක්‍රීඩා ආදී ක්‍රියාකාරකම් ඔස්සේ අකුරු, වර්ණ, නාම පද ආදිය මෙන්ම ඉංග්‍රීසි භාෂාවේ වචන ද උගන්වන ආකාරය නැරඹීමේ අවස්ථාව අපට ලැබිණි. ඔවුන් ඉංග්‍රීසි ගුරුවරියට සුබ උදෑසනක් පතමින් සෙනෙහසින් පිළිගත්තේ ඉංග්‍රීසි ගීතයක් ගායනා කරමිනි. ගුරුතුමිය එදින ඔවුන්ට වර්ණ සඳහා ඉංග්‍රීසි වචන ඉගැන්වීමේ ක්‍රියාකාරකමක් කළාය.

ළමයින්ගේ හසුරු කුසලතා ගොඩනැගීම සඳහා සරල අත්කම් ඉතා වැදගත් බව ගුරුතුමිය කීවාය. එදින ඔවුහු කතුරක් භාවිතා කරමින් පරිස්සමින් රෙදි කපන හැටිත්, සරල යන්ත්‍රයකින් පහන් තිර අඹරන හැටිත් ඉගෙනගත්හ. ගුරුතුමිය ඒ කටයුතුවලට උදව් කිරීම සඳහා අවශ්‍යතාව පරිදි මව්පියන් පාසලට කැඳවා ගන්නීය. ඇය ප්‍රාථමික අංශ භාර ගුරුවරිය ද වූ නිසා විශේෂ අධ්‍යාපන ඒකකයට අවශ්‍ය අමතර සහාය සම්බන්ධීකරණය කරගැනීම ඇයට ඉතා පහසු විය.

විශේෂ අධ්‍යාපන ඒකකය සඳහා ස්ථානය තෝරාගැනීමේදී පාසල් පරිපාලනය දැඩි සැලකිල්ලක් දක්වා ඇති බව අපට දක්නට ලැබිණි. එම පන්ති කාමරය ස්ථානගත කර තිබෙන්නේ ප්‍රාථමික පන්ති සහිත ගොඩනැගිල්ලක කෙළවරේයි. ඒ නිසා ඔවුන්ට ජල කරාම හා වැසිකිළිය ළඟට යන්නට ද පහසුය. එළිමහන් ක්‍රියාකාරකම් සඳහා කුඩා මිදුලක් ද පන්ති කාමරයට යාබදව තිබිණි.

“මේ ළමයි අපේ පාසලේ ජනප්‍රියයි. කිසි කෙනෙකු ඒ ළමයින්ව කොන් කරන්නෙ නැහැ. විෂය සමගාමී වැඩවලදි ඔවුන්ට සම අවස්ථා ලබාදෙන්නට අපි හැමවිටම වගබලාගන්නවා,” යි පාසලේ විදුහල්පතිවරයා අප සමග පැවසීය. “උදාහරණයක් විදියට, හැම විවිධ ප්‍රසංගයකම ඔවුන්ගේ නතර්න අංග ඇතුළත් වෙනවා. ඔවුන් ජනප්‍රිය වෙන්න එක හේතුවක් වන්නේ එයයි. ක්‍රීඩා ආදී වෙනත් අවස්ථාවන්ටත් ඔවුන් සහභාගී වෙනවා.”

විවිධ ප්‍රසංගයේ කාලගෝල දික්තලා නාටකය ඔවුන් ඉදිරිපත් කළ ආකාරය ගුරුතුමියගේ ජංගම දුරකථනයේ දත්ත අතරින් අපට සොයා පෙන්නුවේ ඩවුන් සින්ඩ්‍රෝම් සිසුවෙකි. ඔවුන්ට තමන්ගේ කටයුතු විධිමත් ලෙස කරගන්නා ආකාරය, මාගර්යේ ගමන් කරන ආකාරය, බස්රියක නාමපුවරුව වැනි සරල දේ කියවාගන්නා ආකාරය, අදහස් සන්නිවේදනය කරන ආකාරය, සෞන්දයර් හා ප්‍රාග් වෘත්තීය ක්‍රියාකාරකම් මෙන්ම පරිගණක භාවිතා කිරීමේ කුසලතා ද පාසලෙන් ගොඩනගා දී තිබේ.

පාසලේ කුඩා පරිගණක විද්‍යාගාරයේ ඔවුන්ටත් කාල පරිච්ඡේදයක් වෙන් කර ඇත. ඔවුන් එකිනෙකාට ගැලපෙන අන්දමින් සරල පරිගණක පාඩම් කියා දෙන බව තොරතුරු තාක්ෂණය විෂය උගන්වන ගුරුවරිය පැවසුවාය.

එදින විශේෂ අධ්‍යාපන ඒකකයේ එක් සිසුවියක් පාසල් පැමිණ තිබුණේ නැත. අපි ඒ ඇයිදැයි විමසුවෙමු.

“මව්පියන්ගේ ආථර්ක ගැටලු නිසා සමහර වෙලාවට ඔවුන් දරුවන් පාසල් එවන්නෙ නැහැ. මං ඒ වෙලාවට දුරකථනයෙන් මව්පියන්ට කතාකරලා ළමයින් ගෙන්වාගන්නවා. ඔවුන් මෙහි ඉන්නෙ සතුටින්. ඒ සතුට ඔවුන්ගේ ජීවිතයට ඉතා වැදගත්.” යි සෝමා ගුරුතුමිය පැවසුවාය.

විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට පාසලෙන් ලබන අධ්‍යාපනයෙහි වැදගත්කම කතා කරමින් එක් මවක් මෙසේ කීවාය. “මගේ දුව ඩවුන් සින්ඩ්‍රෝම්. එයා අපේ එකම ළමයා. මම කොහොම හරි එයා පාසල් එක්කෙගෙන එනවා. මුල් කාලෙ අපි ආවෙ බස් එකේ. දැන් බස් ගාස්තු වැඩි නිසා අපි දෙන්නා කතා කර කර පයින් ඇවිත්, යනවා. දුවට අනෙක් ළමයින් එක්ක බස් එකේ යන්නට එන්නටත් තේරෙනවා.”

ඒ සන්සුන්, ගැමි පාසල පුරා ආදරය, සෙනෙහස උතුරා ගලා යන ආකාරය අපි දුටුවෙමු. එහි විශේෂ අධ්‍යාපන ඒකකය වැඩි වැඩියෙන් ආදරය ආකශර්නය වන පංතියකි. ඔවුන් බලන්නට ගිය අපට ඔවුන් ඒ ආදරය ආපසු දුන්නේ ඩවුන් සින්ඩ්‍රෝම් සිසුවකු ස්තුති කතාවක් ද පවත්වමිනි.

"අන්තකර්රණ අධ්‍යාපනය යනු සියලු දරුවන්ට පාසල් යාමට, ඉගෙනීමට සහ දියුණු වීමට අවශ්‍ය කුසලතා වධර්නය කිරීමට සාධාරණ අවස්ථාවක් ලබාදීම සඳහා වඩාත් ඵලදායී ක්‍රමයයි. අන්තකර්රණ අධ්‍යාපනය යන්නෙන් අදහස් කරන්නේ, සියලුම දරුවන් එකම පාසල්වල, එකම පන්තිකාමරවල එකට ඉගෙනීමයි. සාම්ප්‍රදායිකව බැහැර කර ඇති කණ්ඩායම් සඳහා සැබෑ ඉගෙනුම් අවස්ථා එමගින් ලැබේ,"යි එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල[2] පවසයි.

ග්‍රාමීය ප්‍රදේශයක පිහිටි මෙම පාසල අන්තකර්රණ අධ්‍යාපනය අවබෝධ කරගෙන ඇති අධ්‍යාපන පරිසරයකට කදිම උදාහරණයක් ලෙස දැක්විය හැකිය. එහි විශේෂ අධ්‍යාපන ඒකකයට අමතරව වෙනත් පන්තිවලත් යම් යම් දුබලතා ඇති සිසුන් කිහිපදෙනෙකු අනෙකුත් සිසුන් සමග ඉගෙනුම ලබන බව විදුහල්පතිවරයා පැවසීය. ඒ සියලු සිසුන්ට සම අවස්ථා ලබාදෙන්නට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ගුරුවරුන්, සිසුන්, මව්පියන් ඇතුළු පාසල් ප්‍රජාව තුළ ගොඩනගා ඇති බව අපට දකින්නට ලැබුණි. අන්තකර්රණ අධ්‍යාපනය ස්ථාපිත කිරීමේදී එය ඉතා වැදගත් වේ.



[2] https://www.unicef.org/education/inclusive-education